**ශ්‍රී ලංකා රග්බි - 2020**

----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1. තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ (“ශ්‍රී ලංකා රග්බි”) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා රග්බි ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රග්බි සමුච්චිත අරමුදල පසුගිය වර්ෂ හතරක කාලය තුළ රු. මිලියන 56.8 කින් පරිහානියට පත්ව ඇත. සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් සහහ සැසඳීමේදී, සමුච්චිත අරමුදලේ සෘණ ශේෂය සියයට 297 කි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි දැඩි ලෙස බලපානු ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා විධායක කමිටුව විසින් මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | විධායක කමිටුව විසින් මෙම තත්ත්වය සලකා බලා ගැටලුව විසඳීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල<br>රු. | ලබාදී නොමැති සාක්ෂිය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ලැබිය යුතු දෑ | 247,910 | ශේෂය තහවුරු කිරීම | ඉදිරියේදී නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු | වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා සුදුසු |
| ගෙවිය යුතු දෑ | 4,821,935 | ශේෂය තහවුරු කිරීම | | |

| | | | | |
|---|---|---|---|---|
| තොග | 706,180 | භෞතික සත්‍යාපන වාර්තා | ලැබේ. | විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරකට වැඩි කාලයක් තුළ හිඟව පැවති එකතුව රු. 4,442,470 ක් වූ ලැබිය යුතු ශේෂයන් හතක් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ තුනකට වැඩි කාලයක සිට හිඟව පැවති රු. 214,523 ක් වූ ශේෂයක් ද පැවතුණි. | සටහන් කරගන්නා ලද අතර විධායක සභාවට ඉදිරිපත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

**1.6.2 ගෙවිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරකට වැඩි කාලයක සිට පවතින රු. 4,969,450 ක් වූ ගෙවිය යුතු ශේෂයන් හතළිස් එකක් පියවීමට කටයුතු කර නොතිබූ අතර, වටිනාකම රු. 24,258,241 ක් වූ අගයක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට නොවිසඳී පැවතුණි. | සටහන් කරගන්නා ලද අතර ප්‍රමාණවත් පරිදි මුදල් ලැබුණු පසු එය පියවීමට අවශය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් වරින් වර පියවීමට කඩිනමින් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකසු කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ආ) 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසි 7 (xii) වගන්තිය | වර්ෂය ආරම්භවීමට මාස තුනකට පෙර ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරගැනීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,741,462ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,860,940 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,880,522 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වියදම් රු. 16,421,456 කින් වැඩිවීම හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. 7,725,448 ක් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් ශ්‍රී ලංකා රග්බි ආයතනය විසින් පෞද්ගලික ආයතනයක් වෙත පොලී වශයෙන් එකතුව රු. 1,313,722 ක මුදලක් ගෙවා තිබුණි. | දැනට පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දැනට තරගාවලි නොපැවැත්වේ. එම නිසා, අනුග්‍රාහකයන් ද ඉවත් වී ඇති අතර, ශ්‍රී ලංකා රග්බි ආයතනය මේ වනවිට ඇතැම් මූල්‍ය දුෂ්කරතාවයන්ට ලක්ව ඇත. ශ්‍රී ලංකා රග්බි ආයතනයේ කාර්ය මණ්ඩල වැටුප් ද ඇතුළුව අපගේ පරිපාලන පිරිවැය ද සපුරා ගැනීමට හැකියාවක් නොමැත. ඉහත හේතුව නිසා, ණය හිමියන් වෙත නියමිත වේලාවට ගෙවීම් කිරීමට නොහැකි වූ අතර, වත්මන් මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා නව අනුග්‍රාහකයන් සොයාගැනීමට හා එම කටයුතු විධිමත් කිරීමට කමිටුව විසින් උපරිම උත්සහ කරනු ලැබේ. | ඉදිරියේදී මෙම ගැටලුව විසඳීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 14.1(ඒ) සහ (ඔ) වගන්තියට අනුව, ජාතික පාසල් හා පළාත් පාසල් රග්බි පාපන්දු සංගමය ඇතුළු ශ්‍රී ලංකා රග්බි සාමාජිකයන්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය, ශ්‍රී ලංකා රග්බි පාපාන්දු විනිසුරුවරුන් සහ පළාත් රග්බි පාපාන්දු සමාජ විසින් සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී දින 45ක් ඇතුළත වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. තවද, තේරී පත්වූ සෑම | 2021 වර්ෂයේදී මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවට අනුකූලව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

කාර්යාල සාමාජිකයෙකුගේම හා කමිටු සාමාජිකයන්ගේ ජීව දත්ත, සාකච්ඡා සටහන් වල සහතික කළ පිටපත් හා අදාළ වාර්ෂික මහා සභා රැස්වීමේ පැමිණීමේ ලේඛනය, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සහතික කළ පිටපත සහ එවැනි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළු අනෙකුත් ලේඛන වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කළයුතු අතර, ඔවුන්ගේ සාමාජික ලැයිස්තුව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමට මසකට පෙර පැවති තරඟාවලි සහ අනෙකුත් වැඩසටහන් පිළිබඳ විස්තර ද ඉදිරිපත් කළ යුතුය. කෙසේ නමුත්, ශ්‍රී ලංකා රග්බි ආයතනය මේ සඳහා කිසිඳු කියාමාර්ගයක් අනුගමනය කර නොමැත.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රග්බි ආයතනය වෙත සේවක බඳවා ගැනීම් සහ තනතුරු ගණන සම්බන්ධයෙන් අනුමත යෝජනා ක්‍රමයක් නොතිබුණි. | බඳවාගැනීම් සහ සේවක සංඛ්‍යාව සඳහා අනුමත යෝජනා ක්‍රමයක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඵලදායී මානව සම්පත් කළමනාකරණයක් සඳහා අනුමත සේවක බඳවා ගැනීම් සහ සේවක සංඛ්‍යා පිළිබඳ යෝජනා ක්‍රමයක් සකස් කළ යුතුය. |